(අටවැනි පාර්ලිමේන්තුව - තෙවැනි සභාවාරය)

**අංක 2(6).]**

# පාර්ලිමේන්තුවේ අංක 2 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2019 මැයි 24 වැනි සිකුරාදා**

**2019 ජූනි 04 වැනි අඟහරුවාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*

ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් හෝ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීම (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ ආයතන (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මහජන බැංකු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා,— ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත යටතේ නියෝග,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන සමඟ කියවිය යුතු 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ 27 වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2019 මැයි 13 දිනැති අංක 2123/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.05.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*

මුදල් අමාත්‍යතුමා,— රක්ෂණ කර්මාන්ත විධිමත් කිරීමේ පනත යටතේ නියෝග,— 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත විධිමත් කිරීමේ පනතේ 16 වගන්තිය සමඟ කියවිය යුතු 112 වගන්තිය යටතේ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2018 දෙසැම්බර් 31 දිනැති අංක 2104/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.05.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් අමාත්‍යතුමා,— සුරාබදු අඥා පනත යටතේ නිවේදනය (අංක 1),— සුරාබදු අඥා පනතේ (52 අධිකාරය) 22 වගන්තිය යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 මාර්තු 05 දිනැති අංක 2113/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.05.24 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

( අංක 01/2019 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් අමාත්‍යතුමා,— සුරාබදු අඥා පනත යටතේ නිවේදනය (අංක 2),— සුරාබදු අඥා පනතේ (52 අධිකාරය) 12, 14 සහ 22 වගන්ති සමඟ කියවිය යුතු 32 වගන්තිය යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 මාර්තු 05 දිනැති අංක 2113/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.05.24 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

( අංක 02/2019 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් අමාත්‍යතුමා,— සුරාබදු අඥා පනත යටතේ නිවේදනය (අංක 3),— සුරාබදු අඥා පනතේ (52 අධිකාරය) 22 වගන්තිය යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 මාර්තු 05 දිනැති අංක 2113/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.05.24 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

( අංක 03/2019 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා,— සිවිල් ගුවන් සේවා පනත යටතේ නියෝග,— 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 13 වගන්තිය සමඟ කියවිය යුතු 117 වගන්තිය යටතේ ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 සැප්තැම්බර් 06 දිනැති අංක 2087/27 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.05.24 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

(3)

# දින නියමයක් නොමැති යෝජනා පිළිබඳ දැනුම්දීම

පා. 62/'19

ගරු අනුර දිසානායක මහතා

ගරු විජිත හේරත් මහතා

ගරු නිහාල් ගලප්පත්ති මහතා

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා

ගරු බිමල් රත්නායක මහතා

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— අග්‍රාමාත්‍යවරයා, අමාත්‍ය මණ්ඩලය ඇතුළු ආණ්ඩුව කෙරෙහි විශ්වාසභංගත්වය,— වර්ෂ 2019 අප්‍රේල් 21 වැනි පාස්කු ඉරිදා දින කොළඹ, මීගමුව සහ මඩකලපුව යන ප්‍රදේශවල සිදු වූ මරාගෙන මැරෙන ත්‍රස්ත ප්‍රහාර හේතුවෙන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් ඇතුළු දෙසිය පනහකට අධික පිරිසක් ඝාතනය වීමත්, තවත් පන්සීයයකට ආසන්න පිරිසක් තුවාල ලැබීමත් සහ එකී බෝම්බ ප්‍රහාර හේතුවෙන් වූ දේපළ හානිය සම්බන්ධයෙන් අග්‍රාමාත්‍යවරයා, අමාත්‍ය මණ්ඩලය සහ ආණ්ඩුව වෙත නිල වශයෙන් නිසි තොරතුරු ලැබී තිබියදී සාපරාධී නොසැලකිල්ලෙන් පහත සඳහන් කෙරෙන ක්‍රියාවන් කරමින් හෝ නොකර හැරීමෙන් ද:—

(අ) 2019.05.08 වැනි දින අග්‍රාමාත්‍යවරයා පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කළ පරිදි 2014 වර්ෂයේ සිට අයිඑස්අයිඑස් (ISIS) ජාත්‍යන්තර ඉස්ලාම් අන්තවාදී සංවිධානය සමඟ ශ්‍රී ලංකාවේ පිරිස් විවිධ සබඳතා පැවැත්වූ බවත්, විවිධ ක්‍රියාකාරකම්වල යෙදුන බවත් දැන සිටියදී ඒ සම්බන්ධයෙන් නිසි පියවර ගැනීමට අපොහොසත් වීම;

(ආ) විවිධ ඉස්ලාම් ආගමික අන්තවාදී සංවිධාන මුස්ලිම් සමාජය තුළ ක්‍රියාත්මක වන බවට මුස්ලිම් ප්‍රජාව විසින්ම විවිධාකාරයෙන් ආණ්ඩුව සහ වගකිව යුතු ආයතන දැනුවත් කර තිබියදී ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීමට අපොහොසත් වීම;

(ඇ) කාත්තන්කුඩි ප්‍රදේශයේ ජීවත් වන ජනතාවට විවිධ අවස්ථාවල එල්ල කරන ලද තර්ජන සහ ප්‍රහාර සම්බන්ධයෙන් 2019 අප්‍රේල් 21 වැනි දින බෝම්බ පුපුරුවාගෙන මිය ගිය සහරාන් හෂීම් සහ 2019 අප්‍රේල් 26 වැනි දින සයින්දමරුදුහිදී බෝම්බ පුපුරුවාගෙන මිය ගිය ඒ. එල්. එම්. නියාස් යන අයවලුන්ට එරෙහිව අධිකරණය විසින් වරෙන්තු නිකුත් කර තිබියදී සහ එකී වරෙන්තුකරුවන් කාත්තන්කුඩි ප්‍රදේශයේ ප්‍රසිද්ධව විවිධ ක්‍රියාකාරකම්වල යෙදී සිටියදී ඔවුන් අත්අඩංගුවට ගැනීමට හෝ නිසි ලෙස නීතිය ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වීම;

(ඈ) වර්ෂ 2018 දෙසැම්බර් 24 වැනි දින මාවනැල්ලේ දී බුද්ධ ප්‍රතිමාවන්ට හානි කිරීම සම්බන්ධයෙන් සහරාන් හෂීම් ප්‍රමුඛ කණ්ඩායමක් සම්බන්ධ බවට ශ්‍රී ලංකා මුස්ලිම් කවුන්සලය විසින් ජාතික බුද්ධි අංශය වෙත 2018 දෙසැම්බර් 28 වැනි දින දැනුම් දී තිබියදීත්, හා මෙම ප්‍රහාරය සම්බන්ධයෙන් සැක කරමින් කිහිපදෙනෙකු අත්අඩංගුවට ගෙන තිබියදීත් විමර්ශන කටයුතු ඉදිරියට ගෙන යාම වළක්වමින් ඒ සඳහා මැදිහත් වීම් තිබුණු බව ආණ්ඩුවේ අමාත්‍යවරයෙකු විසින්ම ප්‍රකාශ කර තිබීම;

(ඉ) මෙම ප්‍රහාරයන්ට සැලකිය යුතු කාලයකට පෙර සිට ශ්‍රී ලංකාව තුළ ඉස්ලාම් අන්තවාදී සංවිධානවල විවිධ ක්‍රියාකාරකම් පිළිබඳව විශේෂයෙන් සැලකිය යුතු ශ්‍රී ලාංකිකයන් ප්‍රමාණයක් අයිඑස්අයිඑස් (ISIS) සංවිධානය සමඟ බැඳී කටයුතු කිරීම ඇතුළු කරුණු සම්බන්ධයෙන් නීතිමය සහ ආරක්ෂක පියවර ගැනීමට අපොහොසත් වීම;

(ඊ) ආරක්ෂක මණ්ඩලයේ සාමාජිකයෙකු වන අග්‍රාමාත්‍යවරයා ආරක්ෂක මණ්ඩල සභාවාරයන්ට සහභාගි නොවීමෙන් රටවැසියා වෙත ඔහු විසින් ඉටු කළ යුතු මූලික වගකීම් පැහැර හැරීම;

(උ) විදේශීය ඔත්තු සේවාවන් විසින් ශ්‍රී ලංකාව තුළ කතෝලික දේවස්ථාන හා හෝටල් ඉලක්ක කරගෙන මරාගෙන මැරෙන ප්‍රහාරයක් දියත් කෙරෙන බවත්, එයට සම්බන්ධ පුද්ගලයන් හා ඔවුන්ගේ දූරකථන අංක, ජාතික හැඳුනුම්පත් අංක ඇතුළු නිශ්චිත තොරතුරු ලබා දී තිබියදී එම තොරතුරු මත පදනම්ව කටයුතු කිරීම පැහැර හැරීම;

වැඩිමනත් ලෙස 2019.04.21 වැනි දින ප්‍රහාරයන්ට පෙර අදාළ විදේශ ඔත්තු සේවාවන් විසින් නැවතත් මෙම ප්‍රහාරයන් සම්බන්ධයෙන් නිශ්චිතව අනතුරු අඟවා තිබියදී ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම පැහැර හැරීම;

(ඒ) 2019.04.11 වැනි දින නියෝජ්‍ය පොලිස්පති, විශේෂ ආරක්ෂක දිසාව ප්‍රියලාල් දසනායක මහතා විසින් ''Information of an alleged plan attack'' යන ශීර්ෂය හා අංක DIG/SPR/126/4.19 දරන ලිපිය මඟින් 2019 අප්‍රේල් 21 වැනි දින නිශ්චිත ස්ථාන ඉලක්ක කරගෙන සැලසුම්ගත මරාගෙන මැරෙන ප්‍රහාරයන් එල්ලවන බවට, එනම් ''ජාතික තව්හීත් ජමාත් නායක මොහොමඩ් සහරාන් මෙරට මරාගෙන මැරෙන ප්‍රහාරයක් දියත් කිරීමට සැලසුම් කරන ලද බවට තොරතුරක් සම්බන්ධයෙන් රාජ්‍ය බුද්ධි සේවාව මඟින් ලබා දී තිබූ වාර්තාවේ ඇතුළත් කරුණු සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරමින්'' යනුවෙන් සඳහන් ලිපිය පහත නම් සඳහන් එනම්,

- අධ්‍යක්ෂ/ඇමති ආරක්ෂක කොට්ඨාසය
- අධ්‍යක්ෂ / අධිකරණ ආරක්ෂක කොට්ඨාසය
- අධ්‍යක්ෂ / විශ්‍රාමික ජනාධිපති ආරක්ෂක කොට්ඨාසය
- වැඩ බලන අධ්‍යක්ෂ/තානාපති ආරක්ෂක කොට්ඨාසය (iv)
- වැඩ බලන අධ්‍යක්ෂ/ විශ්‍රාමික ජනාධිපති ආරක්ෂක කොට්ඨාසය (v)

අයවලුන්ට පූර්වයෙන් ලබා දී තිබීම හා ඒ පිළිබඳ කටයුතු කිරීම පැහැර හැරීම, යන ඉහත කරුණු අනුව 2019.04.21 වැනි දින සිවිල් වැසියන් ඉලක්ක කරගනිමින් සිදු වූ ත්‍රස්ත ප්‍රහාරය අවශ්‍යයෙන්ම වළකා ගැනීමට හෝ හානිය අවම කරගත හැකිව තිබූ හෙයින්ද;

(ඓ) 2019.04.21 වැනි දින සිදු කරනු ලැබූ ප්‍රහාර මාලාවෙන් පසුව අග්‍රාමාත්‍යවරයා සහ අමාත්‍යවරුන් විසින් එකී ප්‍රහාර මාලාව සම්බන්ධයෙන් වූ වගකීම භාර නොගෙන එම වගකීම වෙනත් පාර්ශ්වයන්ට පැවරීමට උත්සාහ කරමින්ද, රජයේ අමාත්‍යවරුන් විසින් වගකීම් විරහිත, පරස්පර සහ සාවද්‍ය ප්‍රකාශයන් සිදු කරමින් රටේ සාමාන්‍ය ජනජීවිතය හා මහජන ආරක්ෂාව සම්බන්ධයෙන් ව්‍යාකූලභාවයක් සහ අනාරක්ෂිතභාවයක් ඇති වන පරිදි කටයුතු කර ඇති හෙයින්ද;

(ඔ) 2019.04.21 වැනි පාස්කු ඉරිදා දින ප්‍රහාරය සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් සැකකරුවන් සම්බන්ධයෙන් විමර්ශන ක්‍රියාවලියට බාධා කරමින් සහ එකී අපරාධයන් සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කිරීමට බාධා කරමින් හෝ වළක්වමින් ආණ්ඩුවේ සමහර අමාත්‍යවරුන් කටයුතුකර ඇති හෙයින්ද;

(ඔ) 2019.04.21 වැනි දින සිදු වූ ත්‍රස්තවාදී ප්‍රහාර මාලාවෙන් පසුව තවත් එවැනි ප්‍රහාර මාලාවක් ඇති වීම හෝ වෙනත් ආකාරයක ප්‍රචණ්ඩ ක්‍රියාවන් සිදු කිරීම මැඩපැවැත්වීම සඳහා අවශ්‍ය පූර්ණ නීති මාලාවක් රාජ්‍යය සතුව තිබියදී 2019.05.13 වැනි දින ගම්පහ ප්‍රදේශයේ සහ වයඹ පළාතේ සිදු වූ අන්තවාදී ප්‍රචණ්ඩකාරී ක්‍රියා, එනම් මනුෂ්‍ය ඝාතන, දේපළ හානි සහ ජනතාව අතර ගැටුම් ඇතිවීම වැළැක්වීම සඳහා නිසි අවධානයකින් සහ වගකීමෙන් කටයුතු නොකිරීමේ සහ එකී සිද්ධීන් මැඩපැවැත්වීම සඳහා ගතයුතු නිසි ක්‍රමවේදයන් අනුගමනය නොකිරීම මත ජනතාව සම්බන්ධයෙන් රජය විසින් ඉටුකළ යුතු යුතුකම් වගකීම් නිසි ආකාරයෙන් ඉෂ්ට කිරීම පැහැර හැරීමෙන් සහ 2019.04.21 වැනි දින ප්‍රහාර මාලාවෙන් පසුව රටෙහි විවිධ ජනවර්ගයන් අතර නොසන්සුන්කාරී තත්ත්වයන් සහ ප්‍රහාරයන්වලට යොමු වීමේ ප්‍රවණතාවයක් තිබියදී එකී ප්‍රහාරයන් වළක්වා ගැනීමට කටයුතු නොකළ හෙයින්ද;

(ඕ) එකී පාස්කු ඉරිදා දින ප්‍රහාරයෙන් මාසයක් ගතවී තිබියදී, රටෙහි සාමාන්‍ය ආර්ථික ක්‍රියාවලිය නැවත ගොඩනැගීමට අසමත් වී ඇති හෙයින්ද, රටෙහි පාසල් සහ සරසවි අධ්‍යාපන ක්‍රියාවලිය නැවත ගොඩනැගීමට අසමත් වී ඇති හෙයින්ද, රාජ්‍ය සහ පුද්ගලික අංශයේ ක්‍රියාකාරීත්වය නැවත යථා තත්ත්වයට පත් කිරීමට අසමත් වී ඇති හෙයින්ද, ආණ්ඩුවක් වශයෙන් රටෙහි ජනතාව වෙත තමන් විසින් ඉටුකළ යුතු වගකීම් සහ වගවීම් පැහැර හැර ඇති හෙයින්ද; සහ

2019.04.21 වැනි දින ප්‍රහාර මාලාව වැළැක්වීමට අසමත් වූ නිසා මෙන්ම ඉන් පසුවද රටේ ආරක්ෂක තත්ත්වය සහ සිවිල් ජන ජීවිතය යථා තත්ත්වයට පත් නොකිරීම නිසා ඇති වී තිබෙන අරාජික තත්ත්වය මත රටේ අභ්‍යන්තර කටයුතුවලට මැදිහත් වීමට විදේශ රාජ්‍යයන්ට ඉඩකඩ හරිමින් ක්‍රියා කර ඇති හෙයින්ද;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අග්‍රාමාත්‍යවරයා, අමාත්‍ය මණ්ඩලය ඇතුළු ආණ්ඩුව සම්බන්ධයෙන් තවදුරටත් විශ්වාස භංගත්වයට පත්ව ඇති බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.